**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**ඉතිහාසය**

විභාග අංකය / නම :.........................................................................................................

| 9 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

**I කොටස**

- **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) VOC සමාගම ලෙස හැඳින්වූයේ
(i) පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම (ii) පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම
(iii) මදුරාසිය වෙළෙඳ සමාගම (iv) පෙරදිග ඉංග්‍රීසි වෙළෙඳ සමාගම

(02) ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා වන්නේ
(i) බැරන් වැන් එක් (ii) විලෙම් පැලක් ය.
(iii) ෆන් එංගල් බෙක් (iv) ජොරිස් වෑන් ස්පිල්බර්ජන්

(03) 1638 වර්ෂයේ ලන්දේසීන් සමග ගිවිසුමක් අත්සන් කළ රජතුමා වන්නේ,
(i) රාජාධිරාජසිංහ රජු (ii) දෙවන රාජසිංහ රජු (iii) සෙනරත් රජු (iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(04) මෙරට පත්වූ ප්‍රථම නායක්කර් වංශික රජතුමා වන්නේ
(i) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ii) ශ්‍රී විජය රාජසිංහ රජු
(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (iv) රාජාධිරාජසිංහ රජු

(05) ලෑන්ඩ්රාද් උසාවිවල විභාග වූ නඩු වූයේ ,
(i) අපරාධ නඩු (ii) ඉඩම් නඩු (iii) රජයේ නඩු (iv) සිවිල් නඩු

(06) ඉඩම්වල අයිතිය හා අය කළ යුතු බදු ආදී විස්තර ඇතුළත් ලේඛන හැඳින්වූයේ
(i) තෝම්බු (ii) පත්තිරු (iii) ඔප්පු (iv) කුවිතාන්සි

(07) ශ්‍රී ලංකාවේ පාලන ඉතිහාසයේ අවසාන සිංහල රජතුමා වන්නේ ,
(i) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(iii) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (iv) ශ්‍රී විජය රාජසිංහ රජු

(08) ලන්දේසීන් විසින් ආගම් ප්‍රචාරය සඳහා මෙරටේ ආරම්භ කළ ආයතනය වූයේ,
(i) ඉස්කෝල (ii) මීසම (iii) සෙමනේරිය (iv) පාඨශාලාව

(09) ක්‍රි.ව. 1797 වර්ෂයේ ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා මෙරටට පැමිණි කොමිසම හඳුන්වනු ලද්දේ
(i) කෝල්බෲක් කොමිසම (ii) මියුරන් කොමිසම
(iii) ටොරිංටන් කොමිසම (iv) බ්‍රිතාන්‍ය කොමිසම

(10) උඩරට රාජධානියේ ආරක්ෂක රහස් අනාවරණය කරගැනීමට සමත් වූ ඉංග්‍රීසි ජාතිකයා වන්නේ ගැනීම
(i) ජෝන් ඩොයිලි (ii) මේජර් ඩේවි (iii) මැක්ඩෝවල් සෙනෙවියා (iv) ෆන් එංගල්බෙක්

(11) ක්‍රි. ව. 1848 දී "ශ්‍රී වික්‍රම සර්වසිද්ධි" නමින් දඹුල්ලේ දී ඔටුන පැළඳි නායකයා වන්නේ
(i) වීරපුරන් අප්පු (ii) දොරේසාමි (iii) මඩුගල්ලේ දිසාව (iv) ගොංගාලේ ගොඩබණ්ඩා

(12) කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා වන්නේ
(i) පියදාස සිරිසේන මහතා (ii) අනගාරික ධර්මපාලතුමා
(iii) ඩී.බී.ජයතිලක මහතා (iv) ජෝන් ද සිල්වා මහතා

(13) මෙරට දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාරි මාර්ග ප්‍රතිසංස්කරණයට යොමු වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු හා එම වාරිමාර්ග නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. හෙන්රි වෝඩ් A - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම
2. හර්කියුලිස් රොබින්සන් B - කන්තලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම
3. විලියම් ග්‍රෙගරි C - වාරි කර්මාන්ත පිළිබඳ සොයා බැලීමට කාරක සභාවක් පත් කිරීම
4. වෙස්ට් රිජ්වේ D - තිස්සමහාරාම වැව ප්‍රතිසංස්කරණය කිරීම
(i) BDCA (ii) ACDB (iii) CDBA (iv) CBAD

(14) බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට වගා කරන ලද ප්‍රථම ආර්ථික භෝගය වූයේ
(i) කොකෝවා (ii) කෝපි (iii) කුරුඳු (iv) සිංකෝනා

(15) බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කරගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද්දේ
(i) අනගාරික ධර්මපාලතුමා (ii) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා
(iii)පියදාස සිරිසේන මහතා (iv) හෙන්රි ඕල්කට්තුමා

(16) ''උදයභානු'' නමින් පුවත්පතක් ආරම්භ කරන ලද්දේ
(i) එම්. සී. සිද්ධිලෙබ්බේ මහතා (ii) ආරුමුගර් නාවලර් තුමා
(iii) පොන්නම්බලම් අරුනාචලම් මහතා (iv) පොන්නම්බලම් රාමනාදන් මහතා

(17) පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගමේ පාලනය අවසන් කොට ඉන්දියාව පාලනය බ්‍රිතාන්‍ය රජය වෙතට පවරා ගැනීම
සිදුවූයේ කුමන සිදුවීමෙන් පසුව දැයි තෝරන්න.
(i) 1857 සිපොයි කැරැල්ලෙන් පසු
(ii) ඉන්දියාවේ ප්‍රංශ බලය දුර්වල වීමෙන් පසු
(iii) ඉන්දියාවේ මුගල් අධිරාජ්‍ය පරිහානියෙන් පසු
(iv) බහදුර්ෂා ඉන්දියාවේ අධිරාජයා ලෙස ප්‍රකාශ කිරීමෙන් පසු

(18) අවිහිංසාවාදී සටන් ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ
(i) දඩාබායි නඹරෝජි (ii) සුරේන්ද්‍රනාත් බැනර්ජී
(iii) ජවහර්ලාල් නේරු (iv) මහත්මා ගාන්ධි

(19) ඉන්දියාවේ ආගමික පුනරුදයකට අඩිතාලම දැමූ රාම් මෝහන් රෝයි විසින් පිහිටුවන ලද සංවිධානය වන්නේ
(i) බ්‍රහ්ම සමාජය (ii) චම්පරන් ව්‍යාපාරය
(iii) ප්‍රාර්ථනා සමාජය (iv) ආර්ය සමාජය

(20) ජලියන්වලා බාග් ඛේදවාචකය ලෙස හැඳින්වෙන්නේ
(i) නිදහස් සටනේ ඉන්දීය නායකයන් ඝාතනය කිරීම
(ii) ඉන්දීය සටන්කාමී හමුදාවන් වෙඩිතබා ඝාතනය කිරීම
(iii) ඉන්දියානුවන් විසින් බ්‍රිතාන්‍ය හමුදාවන් වෙඩිතබා ඝාතනය කිරීම
(iv) නිරායුධ ඉන්දියානුවන් පිරිසකට වෙඩිතබා මිනිසුන් 400 ක්පමණ ඝාතනය කිරීම

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනිකුත් ප්‍රශ්න අතුරෙන් හතරකට පිළිතුරු සපයන්න.**

(01) (අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) ඉංග්‍රීසින්ගේ වැඩි අවධානයක් යොමු වූ A අක්ෂරයෙන් දැක්වෙන ස්වභාවික වරාය හා B අක්ෂරයෙන් දැක්වෙන කුරුඳු බහුලව වැවෙන ප්‍රදේශය නම් කරන්න.

(ii) මෙරට පොල් පර්යේෂණ ආයතනය දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද?

(iii) ක්‍රි.ව. 1848 දෙවන නිදහස් අරගලයේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ මාතලේ ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරයා විසින් ප්‍රතිසංස්කරණය කළ කලා වැව දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) පෘතුගීසින්ට හා ලන්දේසීන්ට අත්පත් කර ගැනීමට නොහැකි වූ උඩරට රාජධානියේ මහනුවර නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 06)




(ආ) (i) A රූපයෙන් දැක්වෙන්නේ කවුද?

(ii) මෙතුමා ශ්‍රී ලංකාවට පැමිණියේ කුමන රටේ සිට ද?

(iii) මෙතුමා මෙරටට පැමිණීමට බලපාන ලද හේතුව කුමක ද?

(ලකුණු 03)

A රූපය



(ඇ) (i) B රූපයෙන් දැක්වෙන්නේ කව් ද?

(ii) ඇය විවහ වී සිටියේ කුමන රජු සමග ද?

(iii) ඇය සහ රජු සැඟව සිටියේ කවර ස්ථානයක ද?

(ලකුණු 03)

B රූපය



(02)

(i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ පහත දැක්වෙන ජාතීන්ගේ මව් රටවල් ලියා දක්වන්න.

a. පෘතුගීසින්

b. ලන්දේසින් (ලකුණු 02)

(ii) ලන්දේසින් විසින් සබඳතා පවත්වන ලද උඩරට රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(iii) මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගත් ලන්දේසින් සිය ආගම් ප්‍රචාරයට හා අධ්‍යාපන කටයුතු සඳහා ගත් ක්‍රියාමාර්ග 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) ලන්දේසි පාලනය නිසා ඇති වූ සමාජ හා සංස්කෘතික බලපෑම් 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03)

(i) ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම් 02ක් නම් කරන්න (ලකුණු 02)

(ii) ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම් 2ක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන පාලන ක්‍රම 03 නම් කරන්න. (ලකුණු 03)

(iv) උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගලය පැවති ආකාරය පිළිබඳ කරුණු 03ක් දක්වා එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04)

(i) ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය යටත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු 02ක් ලියන්න. (ලකුණු 02)

(ii) ක්‍රි. ව. 1818 සටනේ නායකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ක්‍රි.ව. 1818 නිදහස් සටනට අසාර්ථක වීමට බලපෑ කරුණු 03ක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iv) ක්‍රි.ව.1848 සටන අසාර්ථක වීමට හේතු වූ කරුණු 03ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05)

(i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට කිතු දහම ප්‍රචාරය කිරීම සඳහා පැමිණි මිෂනාරි සමාගම් 02ක් ලියන්න. (ලකුණු 02)

(ii) මිෂනාරි සමාගම් තම ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) පහත සඳහන් ග්‍රන්ථ/ප්‍රකාශන ඉදිරිපත් කළ පුද්ගලයන් නම් කරන්න. (ලකුණු 03)

a. සිදත් සඟරා සන්නස
b. සිංහල බෞද්ධයා
c. ස්කන්ද පුරාණම්

(iv) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 03ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06)

(i) බෞද්ධ පුනරුද ව්‍යාපාරයට නායකත්වය දෙමින් පහත කාර්යයන් ඉටුකළ පුද්ගලයින් කවුරුන්දැයි සඳහන් කරන්න.

a. ලංකෝපකාර මුද්‍රණාලය ආරම්භ කිරීම

b. ඉරුදින දහම් පාසල් ඇරඹීම (ලකුණු 02)

(ii) ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරයට නායකත්වය දුන් එම්.සී.සිද්ධිලෙබ්බේ මහතාගෙන් සිදු වූ සේවාවන් 02ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) අනගාරික ධර්මපාල තුමාගේ සේවා 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 03ක් ලියා ඉන් එකක් විස්තර කරන්න.(ලකුණු 05)

(v)

(07)

(i) ඉන්දියානු ජාතික සංගමයේ

a - මධ්‍යස්ථ මතවාදී නායකයෙකු

b - අන්තවාදී නායකයෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් වන්නේ ඉන්දියාවේ ආගම් කීපයක් තම ආගම් පුනර්ජීවනය ඇති කිරීමට පිහිටුවාගත් සංවිධාන කීපයකි. එම ආගමික සංවිධාන බිහි වූයේ කුමන ජන කණ්ඩායම් අතර දැයි ලියා දක්වන්න. (ලකුණු 02)

a. බ්‍රහ්ම සමාජය

b. සිං සභා

(iii) ක්‍රි.ව. 1857 සිපොයි කැරැල්ලට ඇතිවීමට බලපෑ හේතු 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) ඉන්දියාව තුළ ඉංග්‍රීසි බලය පිහිටුවීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කළ උපායශීලී ප්‍රතිපත්ති 03ක් සඳහන් කර ඒ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)